## **තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ සාමාජික ධුරයකට පත් කිරීම**

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ සාමාජික ධුරයක ඇතිවීමට නියමිත පුරප්පාඩුව සඳහා පත්කිරීමට ගරු ජනාධිපතිතුමා වෙත නිර්දේශ කිරීම සඳහා 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 12(1) (ආ) වගන්තිය ප්‍රකාරව, <u>**ප්‍රකාශකවරුන්ගේ, කර්තෘවරුන්ගේ සහ මාධ්‍යවේදීන්ගේ සංවිධාන**</u> වෙතින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව නාමයෝජනා කැඳවයි.

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 12(2) (අ) (i) වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ සාමාජිකයන් නීතිය, පාලනය, රාජ්‍ය පරිපාලනය, සමාජ සේවා, පුවත්පත් කලාවේදී, විද්‍යා හා තාක්ෂණ හෝ කළමනාකරණ යන ක්ෂේත්‍රවල සාධනය කළ දැනීමක්, අත්දැකීම් හා ප්‍රවීනත්වය සහිත පොදු සමාජ ජීවිතයේදී සුවිශේෂී තැනැත්තන් විය යුතුය.

තවද, 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 12(2) (අ) (ii) සිට (v) වගන්තිය ප්‍රකාරව, එසේ නාමයෝජනා කරනු ලබන නාමිකයන් -

- පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හෝ යම් පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු නොවිය යුතුය;
- යම් රාජ්‍ය හෝ අධිකරණ ධුරයක් හෝ වෙනත් ලාභදායී ධුරයක් දරන තැනැත්තන් නොවිය යුතුය;
- යම් දේශපාලන පක්ෂයකට සම්බන්ධ නොවිය යුතුය;
- යම් ව්‍යාපාරයක් කරගෙන යනු නොලබන හෝ යම් වෘත්තියක නොයෙදිය යුතුය.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වෙබ් අඩවියෙහි (www.parliament.lk) "ක්ෂණික පිවිසුම්" යටතේ '*තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ සාමාජික ධුරයකට පත් කිරීම*' නමින් පළ කර ඇති නාමයෝජනා පත්‍රයට අනුකූලව නාමයෝජනා සකස් කළ යුතු ය. යථා පරිදි සම්පූර්ණ කරන ලද නාමයෝජනා **2026 ජූලි 06** වැනි දින හෝ ඊට පෙර

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වැඩබලන මහ ලේකම්**
**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව - කාර්යාලය**
**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**
**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ**

යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ constitutionalcouncil@parliament.lk යන විද්‍යුත් ලිපිනයට යොමු කළ යුතුය.

කරුණාකර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ හෝ විද්‍යුත් තැපෑලෙහි විෂයය වශයෙන් '*තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ සාමාජික ධුරයකට පත් කිරීම*' යනුවෙන් සඳහන් කරන්න.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නියමය පරිදි පළ කරන ලදී.

**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ වැඩබලන මහ ලේකම්**
**ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව - කාර්යාලය**
**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව**
**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ**
**2026.06.26**